# කාත්තන්කුඩි නගර සභාව

---

1. මූල්‍ය ප්‍රකාශ

------------------

1.1 මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කිරීම

--------------------------------

සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශ 2014 අප්‍රේල් 02 දින ද, ඉකුත් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශ 2013 මාර්තු 13 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂය සඳහා වූ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2014 දෙසැම්බර් 04 දින සභාවේ, සභාපතිවරයා වෙත නිකුත් කරන ලදි.

1.2 මතය

--------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශ වලින් 2013 දෙසැම්බර් 31 දිනට කාත්තන්තුඩි නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශ පිළිබඳ අදහස් දැක්වීම

----------------------------------------

1.3.1 ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල වීම

-------------------------------------------------------

පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යාංශ ලේකම්ගේ 2014 ජනවාරි 27 දිනැති පීඑල්/05/පීඒ/එස්එල්පීඑස්ඒඑස් දරන චක්‍රලේඛය අනුව රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත වලට අනුව මූල්‍ය ප්‍රකාශ පිළියෙල කර නොතිබුණි.

1.3.2 ගිණුම්කරණ අඩුපාඩු

-----------------------

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂය අවසානයට සභාවේ තිබූ පිරිවැය රු.1,460,000 ක්වූ පරිගණක 23 ක් ගිණුම්වලට ගෙන නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදී සභා අරමුදලින් මිළදීගෙන තිබූ රු.11,900,000 ක් වටිනා "බැකෝ" යන්ත්‍රය ගිණුම්වලට ගෙන නොතිබුණි.

1.3.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ අයකර ගතයුතු රු.23,500 ක බලපත්‍ර ගාස්තු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) මිය ගිය නිලධාරීන් දෙදෙනෙකුගෙන් අයවිය යුතු රු.42,037 ක ණය ශේෂය මරණ පාරිතෝෂිකයෙන් හෝ ඇපකරුවන්ගෙන් අයකර ගැනීම සඳහා 2014 අගෝස්තු 30 දින දක්වා කටයුතු කර නොතිබුණි.

1.3.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

මූල්‍ය ප්‍රකාශ වල දක්වා තිබූ පහත දැක්වෙන විෂයයන් ඉදිරියෙන් පෙන්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

| විෂයය | වටිනාකම | ඉදිරිපත් නොවූ සාක්ෂි |
|---|---|---|
| | රු. | |
| ඉඩම් හා ගොඩනැගිලි | 23,362,316 | හිමිකම් ඔප්පු |
| යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ | 2,501,435 | ස්ථාවර වත්කම් ලේඛන, සහ සමීක්ෂණ මණ්ඩල වාර්තා |
| මෝටර් වාහන | 2,980,814 | |
| ලීබඩු හා සවිකිරීම් | 2,937,684 | |
| කාර්යාලීය උපකරණ | 494,595 | |
| පුස්තකාල පොත් | 1,251,373 | |

1.3.5 නීති, රීති සහ රෙගුලාසි යනාදියට අනුකූල නොවීම්

පහත සඳහන් නීති, රීති සහ රෙගුලාසිවලට අනුකූල නොවූ අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති, රීති සහ රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) නගර සභා ආඥා පනත (අධිකාරය 255) | |
| (i) 177(2) වගන්තිය | සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශ වල සාරාංශය මහජනයාගේ දැන ගැනීම සඳහා |

රජයේ ගැසට් පත්‍රයේ ප්‍රකාශ කිරීමට සභාව විසින් 2014 ජූලි 31 දින දක්වා කටයුතු කර නොතිබුණි.

(ii) 180(1) වගන්තිය

එක් එක් ගිණුම් වර්ෂය සඳහා සභාවේ සභාපති විසින් විස්තරාත්මක වාර්ෂික පාලන වාර්තාවක් පිළියෙල කළයුතු වුවද එවැනි වාර්තාවක් සමාලෝචිත වර්ෂය සඳහා සකස්කර නොතිබුණි.

(iii) 227(1) වගන්තිය

නගර සභාවේ මන්ත්‍රීවරුන්, නිලධාරීන් සහ සේවකයින් සෘජුවම හෝ වක්‍රව සභාවේ කොන්ත්‍රාත් වැඩ වලට සම්බන්ධ නොවිය යුතු වුවද එයට පටහැනිව සභාවේ සභාපතිගේ සහෝදරයෙකුට අයත් වෑන් රථය සභාව විසින් කුලියට ලබාගෙන සමාලෝචිත වර්ෂයේදී රු.53,595 ක් කුලිය වශයෙන් ගෙවා තිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශ අනුව, 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම් ඉක්මවූ ආදායම රු.4,444,446 ක් වූ අතර එයට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ආදායම ඉක්මවූ පුනරාවර්තන වියදම් රු.64,660 ක් විය. ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.4,509,106 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි.

### 2.2 ආදායම් කළමනාකරණය

#### 2.2.1 ආදායම් රැස් කිරීමේ කාර්ය සාධනය

සභාව විසින් ඉදිරිපත් කර තිබූ සමාලෝචිත වර්ෂයයේ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් අතර සැළකිය යුතු විචලනයන් නිරීක්ෂණය විය.

| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත ආදායම | තථ්‍ය ආදායම | වෙනස | ප්‍රතිශතය |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | % |
| වරිපනම් හා බදු | 7,500,000 | 6,807,470 | 692,530 | 9.2 |
| සේවා ගාස්තු | 5,825,000 | 4,235,892 | 1,589,108 | 27.3 |
| වරෙන්තු ගාස්තු | 2,575,000 | 2,506,094 | 68,906 | 2.7 |
| මුද්දර ගාස්තු | 5,200,000 | 3,688,199 | 1,511,801 | 29.1 |

### 2.2.2 වරිපනම් හා බදු

නගර සභා ආඥා පනතේ (අධිකාරිය 255) 160 වන වගන්තිය අනුව නගර සභා බල ප්‍රදේශයේ තිබෙන ඉඩම් සහ ඉදිකරන ලද ගෙවල්, ගොඩනැගිලි වෙනුවෙන් 2013 වර්ෂය අවසානය දක්වා අයවිය යුතු එකතුව රු.4,389,991 ක වරිපනම් බදු අයකරගෙන නොතිබුණි.

### 2.2.3 උසාවි දඩ

එක් එක් ආඥා පනත් යටතේ මහේස්ත්‍රාත් අධිකරණයෙන් 2013 දෙසැම්බර් 31 වන දිනට ලැබිය යුතු රු.749,294 ක මුදලක් පළාත් සභාවේ ප්‍රධාන ලේකම්ගෙන් ලබා ගැනීම සඳහා අවශ්‍ය කටයුතු කර නොතිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ත්‍රිකුණාමලය හා කින්නියාව අතර මගී ප්‍රවාහන සේවය සඳහා යොදාගෙන තිබූ මගී ප්‍රවාහන බෝට්ටුව එම තිබූ නගර අතර පාලම් ඉදිකළායින් පසු රු. 323,550 ක් වැයකර කාත්තන්කුඩියට ගෙන එනලද නමුදු එය වර්ෂ දෙකක පමණ කාලයක් ප්‍රයෝජනයට ගෙන නොතිබුණි.

(ආ) පළාත් පාලන ආයතනවල විශ්‍රාම වැටුප් ක්‍රමය සඳහා දායක මුදල් මාසිකව ගෙවීමට සභාව අපොහොසත් වී තිබුණු අතර 1995 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා රු.2,375,058 ක දායක මුදල් ගෙවිය යුතුව තිබුණි.

(ඇ) 1987 වර්ෂයේදී ප්‍රාදේශීය සභා ආරම්භ කිරීමට ප්‍රථම නගර සභා වශයෙන් ක්‍රියාත්මක වූ කාලයේ ලංකා විදුලි බල මණ්ඩලය වෙනුවෙන් මහජනයා වෙත විදුලිය සපයා තිබුණි. මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

(i) විදුලිබල මණ්ඩලයට ලබාදී තිබූ රු.2,399,352 ක අත්තිකාරම් මුදල අයකර ගැනීම සඳහා සභාව විසින් 1991 වර්ෂයේ සිට සුදුසු ක්‍රියා මාර්ග ගෙන නොතිබුණි.

(ii) විදුලිය සැපයීම වෙනුවෙන් මහජනතාවගෙන් විදුලිබල මණ්ඩලයට ගෙවිය යුතුව තිබූ රු.6,642,880 ක විදුලි හිඟ මුදල අයකර ගැනීම සඳහා පසුගිය අවුරුදු 20 කට වඩා වැඩි කාලයක් තුළ කටයුතු කර නොතිබුණි.

3.2 බැකෝ ලෝඩර් යන්ත්‍රයක් මිළදී ගැනීම
-----------------------------------------------

සභාව විසින් සමාලෝචිත වර්ෂය තුළ රු.11,900,000 පිරිවැයට "බැකෝ ලෝඩර්" (JCB වර්ගය JCB 3CX 4WD) මිළදීගෙන තිබුණි. මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) බැකෝ යන්ත්‍රය මිළදී ගැනීම සම්බන්ධයෙන් මිළ ගණන් විවෘත කිරීමේ මණ්ඩලයේ සාමාජිකයින් විසින් 2013 මාර්තු 06 දින විවෘත කරන ලද අතර විවෘත කිරීමේ මණ්ඩලයේ සාමාජිකයෙකු වන සභාවේ ලේකම්වරයා විවෘත කිරීමේ මණ්ඩලය කටයුතුවලට සහභාගි වී අත්සන් තබා නොතිබුණි.

(ආ) ආයතන දෙකක් අඩු මිළ ගණන් ඉදිරිපත් කර තිබූ නමුත් උපරිම මිළගණන් සඳහන් කර තිබූ ආයතනයක් ඉදිරිපත් කර තිබූ මිළගණන වන රු.11,900,000 කට එක්සත් රාජධානයේ නිෂ්පාදනය වූ යන්ත්‍රයක් මිළදීගෙන තිබුණි. කෙසේ වෙතත් වර්ගය "JCB 3DX Super" යන්ත්‍රය මිළදී ගත්තේ නම් රු.2,740,000 ක මුදලක් ඉතිරිකර ගත හැකිව තිබුණි.

(ඇ) ගිවිසුම අනුව, බෙදා හැරීම් ආයතනයෙන් නොමිලේ නඩත්තු සේවා (Free Service) ලබාගත් හැකිව තිබියදීත් සභා අරමුදලින් රු.186,696 ක් වියදම් කර සමාලෝචිත වර්ෂයේදී දෙවතාවක් නඩත්තු සේවා කර තිබුණි.

(ඇ) මන්මුනේ පත්තු ප්‍රාදේශීය සභාව විසින් සමාලෝචිත වර්ෂයේදී එම ආයතනයෙන්ම මෙම වර්ගයේම "බැකෝ ලෝඩර්"යන්ත්‍රයක් රු.11,800,000 ක මුදලකට මිළදීගෙන තිබුණි.

3.3 සණ අපද්‍රව්‍ය කළමනාකරණය
----------------------------------

සභා බල ප්‍රෙද්ශය ඇතුළත එකතු කරන කසල අඩ්ඩාලචේනයි ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පිහිටුවා තිබූ "Engineered Landfill Facility" යන ස්ථානයට ගෙන යාම සඳහා සමාලෝචිත වර්ෂයේදී පුද්ගලික අංශයෙන් "ඩිපර්" වර්ගයේ වාහන කුලියට ලබාගෙන ඒ සඳහා රු.2,309,150 ක වියදමක් දරා තිබුණි.
මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) අඩ්ඩාලචේනයි ප්‍රාදේශීය සභාවට අයත් කසල රැස් කරන ස්ථානයේ අපද්‍රව්‍ය දැමීම වෙනුවෙන් අවස්ථා පහකදී රු.225,000 ක් කුලී වශයෙන් ගෙවා තිබූ නමුත් එම ස්ථානයේ අපද්‍රව්‍ය දැමූ බවත් ඔප්පු කිරීම සඳහා අදාළ වාහන අයිතිකරුවන් කුවිතාන්සි ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) මිළගණන් කැඳවීමේ ක්‍රියා මාර්ග අනුගමනය නොකර අපද්‍රව්‍ය ප්‍රවාහන කුලි වශයෙන් එක් අවස්ථාවකදී රු.448,800 ක් සභාවේ ටෙන්ඩර් ක්‍රියා පරිපාටියට සම්බන්ධ පුද්ගලයෙකුට ගෙවා තිබුණි.

(ඇ) "පිළිසරු" වැඩසටහන යටතේ රු.1,669,227 ක වියදමින් සමාලෝචිත වර්ෂයේදී කොම්පෝස්ට් පොහොර මධ්‍යස්ථානයක් ඉදි කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

(i) කොම්පෝස්ට් මධ්‍යස්ථානයක් ඉදිකිරීම සඳහා රු.6,500,000 ක් වැයකොට මහජනතාවට අයත් ඉඩම් කැබලි දොළහක් මිළදී ගෙන තිබුණි. කෙසේ වෙතත් ඉඩමේ වෙළඳපොල වටිනාකම තක්සේරු දෙපාර්තමේන්තුවෙන් තක්සේරු කර නොතිබුණි.

(ii) ඉඩමේ ඔප්පු ලිවීම සඳහා වූ ගාස්තුව වශයෙන් රු.326,500 ක මුදලක් ඉඩම් හිමියන්ගෙන් අය නොකර සභා අරමුදලින් පුද්ගලික නීතිඥවරයෙකුට ගෙවා තිබුණි.

4. ගිණුම් කටයුතුභාවය හා යහ පාලනය
----------------------------------------

4.1 අභ්‍යන්තර විගණනය
------------------------

එක් එක් පළාත් පාලන ආයතන තමන්ගේ හැකියාව අනුව අභ්‍යන්තර විගණන අංශයක් පිහිටුවා ගතයුතු බව පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය 2005 නාවැම්බර් 08 දිනැති අංක 03 දරන පළාත්පාලන ප්‍රතිසංස්කරණ චක්‍රලේඛයේ 8 වන වගන්තියේ දක්වා තිබූ පරිදි සභාවේ අභ්‍යන්තර විගණන අංශයක් පිහිටුවා නොතිබුණි.

4.2 අයවැය පාලනය
------------------

අයවැයගත වියදම් සහ තථ්‍ය වියදම් අතර 47 % සිට 85 % දක්වා විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛණය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් වශයෙන් යොදාගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

5. පද්ධති හා පාලන
--------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) කොන්ත්‍රාත් පරිපාලනය

(ඇ) ස්ථාවර වත්කම් පාලනය

(ඈ) ආදායම් කළමනාකරණය

(ඉ) අයවැය පාලනය